# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙහි වික්‍රාශනය හා ව්‍යාපාර ගිණුම්කරණ අධ්‍යයනයේ විෂය සාධනය ඇගයීම පිණිස භාවිතා කෙරෙන පරීක්ෂණ විධි හා පාසල පදනම් කරගත් ඇගයීම් සැලසුම්වල විෂය වලංගුතාව පිළිබඳ විමර්ශණාත්මක අධ්‍යයනයක්


**W.S.S.** හේමරත්න

විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන විශේෂ උපාධිය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
පශ්චාත් අධ්‍යාපන උපාධි ඩිප්ලෝමා
කොළඹ විශ්ව විද්‍යාලය



UCLIB
551093


අධ්‍යාපනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන
පර්යේෂණාත්මක නිබන්ධනයත්
අධ්‍යාපන පීඨය
කොළඹ විශ්ව විද්‍යාලය
2004 / 2005

# සාරාංශය

මිනිසා යනු හුදකලා නොවූ සමාජශීලී සත්වයෙකි. සංකීර්ණ සමාජය තුළ අධ්‍යාපනය යනු වියුක්ත සංකල්පයකි. එය සංකීර්ණ වූත් පුළුල් වූත් ක්‍රියාවලියකි. මිනිසා විධිමත්, නොවිධිමත් හා අවිධිමත් ක්‍රම මගින් ජීවිතය හා බැඳුනු යාවජීව අධ්‍යාපනයක් ලබයි.

විධිමත් අධ්‍යාපන ආයතනය පාසලයි. සාක්ෂරතාව පිළිබඳ පරිචයක් ලබා දෙන පාසල නියමිත විෂයය මාලාවක් මගින් විවිධ විෂයයන් ප්‍රගුණ කරවයි. මේ පිළිබඳව විවිධ විද්වත්හු අදහස් දක්වා ඇත. අද ද අදහස් දක්වති. ඉදිරියටත් එසේමය. මෙම පර්යේෂනාත්මක නිබන්ධනයේ අරමුණ වී ඇත්තේ සමාජ කාර්යක්ෂමතාව උදෙසා අධ්‍යාපනයේ පරමාර්ථ විග්‍රහ කරමින් කරන ලද විග්‍රහ විමර්ශනය කරමින් අධ්‍යාපන පරමාර්ථ හඳුනාගෙන ඒවා සාක්ෂාත් කර ගැනීමට ගන්නා ලද ක්‍රියා මාර්ගයන් ව්‍යාපාර හා ගිණුම්කරණ විෂයය මගින් පර්යේෂණය කිරීමයි.

ලෝකයේ අභියෝග වලට මුහුන දී සමාජානුයෝජනය වීමත් විවිධ අවස්ථා මගින් සමාජ කාර්යයට උරදීම සඳහා පුද්ගලයින් සැකසුන අධ්‍යාපනයයි. එම කාර්යය භාරයේදී මෙතෙක් ශ්‍රී ලංකාව තුළ 1970 වර්ෂයෙන් පෙර හා පසුත් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සිදුවූ පරීක්ෂණ ක්‍රම නිරීක්ෂිකාවගේ අවධානයට යොමුව ඇත.

මේ සඳහා පරිච්ඡේද 4 ක් ඔස්සේ තම පරීක්ෂණ කටයුතු පුළුල් ලෙස මෙහෙයවන පර්යේෂිකාව පරීක්ෂණ ක්‍රම හා එහි ප්‍රභේද සැළකිල්ලට බඳුන් කෙරේ. ලාංකීය අධ්‍යාපන ක්‍රියාදාමය තුළ ශිෂ්‍ය සාධනය හා සිසුන් තෝරා ගැනීම සඳහා වර්තමානයේ පරීක්ෂණ ඇගයීම් ක්‍රම භාවිත කෙරේ. පරීක්ෂණ හා ඇගයීම් පිළිබඳ වර්ගීකරණ හා ප්‍රභේද ඒ ඒ වකවානු වල විවිධ අධ්‍යාපනඥයන්ගේ සැළකිල්ලට භාජනය විය.

පරීක්ෂණ අතර සාධන අභියෝගතා හා අනාවරණ පරීක්ෂණ භාවිත කෙරේ. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙ.) විභාගය සාධන පරීක්ෂණයකි. විවිධ ප්‍රතිසංස්කරණ මගින් වෙනස් කිරීමට උත්සාහ ගත්තද ප්‍රජානන හැකියාවන් මැනුම පමණක් වීම දුර්වලතා ලෙස හඳුනාගෙන ඇත. මෙම දුර්වලතා නිසා ශිෂ්‍යයන් හට ප්‍රවීනතා මට්ටම් ලබාදෙන ඇගයීම් ක්‍රමයන් අවශ්‍ය බව මතුවිය. ඒවායේද දුර්වලතා නිසා පාසැල් පාදක ක්‍රියාවලියන් තුළින් ශිෂ්‍යයන් ක්‍රියාකාරී වන ගුරුවරයා එයට පහසුකම් සපයන්නෙකු බවට පත්වේ. පළමු පරිච්ඡේදය තුළ උක්ත කාරණ පුළුල් ලෙස විමර්ශනයට ගෙන ඇත.

දෙවන පරිච්ඡේදය තුළ අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයේ විකාශනය හා ස්වභාවය පිළිබඳ අධ්‍යයනය යෙදේ. න්‍යායාත්මකව යොමු වූ ප්‍රශ්න පත්‍රවල ව්‍යුහය ප්‍රජානන ක්ෂේත්‍රය ඔස්සේ විහිදුනි. ආවේදන හා මනෝචාලක ක්ෂේත්‍රය පුළුල් කරන ප්‍රායෝගික ඇගයීම්වල අවශ්‍යතාවය මතුවී ආ ආකාරයත්, ඒවා පාසල් පාදක ඇගයීම් දක්වා විකාශනය වූ ආකාරයත් නිරීක්ෂණය කරන අතර ව්‍යාපාර හා ගිණුම්කරණ විෂයයේ විකාශනය හා ස්වභාවය පුළුල් ලෙස නිරීක්ෂණයට ලක්කොට ඇත. ඒ ඒ අධ්‍යාපන පතිසංස්කරණ වලදී ව්‍යාපාර හා ගිණුම්කරණ විෂයට හිමිවූ ස්ථානය හා එහි විකාශනය අධ්‍යයනය කෙරේ.

ව්‍යාපාර හා ගිණුම්කරණ විෂයයන් දෙකක් සංකලනය වූ විෂයයකි. මෙය විෂයය හැම මිනිසෙකුගේම එදිනෙදා ජීවිතය හා බැඳී පවතින අතර ව්‍යාපාර ලෝකයටද සම්බන්ධය අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙ.) විභාගයෙන් ගිලිහෙන්නන් සඳහා ස්වයං රැකියාවකට හෝ වෘත්තියකට හෝ අවශ්‍ය දැනුමත් වැඩ ලෝකයට උචිත ප්‍රායෝගික කුසලතා වලින් පරිපූර්ණ වූ පිරිසක් පාසලින් බිහි කිරීමත් මෙහි පරමාර්ථ වෙයි. තේමා 16 ක් ඔස්සේ 10 ශ්‍රේණිය හා 11 ශ්‍රේණි තුළ අධ්‍යයන කටයුතු කෙරේ. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙ.) විභාගය සම්බන්ධ පරීක්ෂණ හා ඒවායේ තොරතුරුද එහි වලංගුතාවද පරීක්ෂණයට ලක්කොට ඇත.

එහිදී පාසල් පදනම් ඇගයීම් වල ස්වභාවය හා ඒ සඳහා භාවිතා කරන විධික්‍රම පර්යේෂණයට යොමුවී ඇත. ඉගෙන ගන්නා දේ ජීවිත පැවැත්මට අදාල විය යුතුය, යන පුළුල් අරමුණ ඉෂ්ඨ සිද්ධ කර ගැනීම සඳහා අධ්‍යයනය යොමු වෙයි. ඇගයීම් සතු වලංගුතාව විශ්වාසනීයත්වය හා ප්‍රායෝගික බව පරීක්ෂණයක තිබිය යුතු මූලික ගුණාංග වෙයි. මේවායින් පිරිපුන් ඇගයීම් අවස්ථාවක සාරවත් බව ඇගයීමට ලක්කොට ඇත.

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙ.) විභාගයේ අන්තර්ගත මෙම විෂය ළමයාගේ ස්වකැමැත්ත මත තෝරාගෙන 10, 11 වන ශ්‍රේණිවල වසර දෙකක් ව්‍යාපාර හා ගිණුම්කරණ විෂය හැදෑරීමෙන් පසු විභාගයට මුහුණ දෙයි. ව්‍යාපාර ලෝකයට ආර්ථික ලෝකයට නැතිවම බැරි විෂයක් නිසා වැඩි පිරිසක් තෝරා ගන්නා අතර ඉන් බහුතරය අසමත් වෙයි. එයට බලපාන විවිධ හේතු සාකච්ඡා කරමින් ඇගයීම් වල වටිනාකම් සාකච්ඡාවට යොමු කොට ඇත .

මේ සඳහා නියැදිකරණය හා නියැදි භාවිතයට ගෙන ඇත. වඩා නිරවද්‍යතාවයෙනුත් ගැඹුරෙනුත් අධ්‍යයනය කිරීම සඳහා ප්‍රථම නියැදිය වශයෙන් 2004, 2003, 2002 වර්ෂ වල අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙ.) විභාගයේ ව්‍යාපාර හා ගිණුම්කරණ විෂයේ වර්ෂ 3 ක ප්‍රශ්න පත්‍ර තෝරා ගෙන ඇත. පර්යේෂණයට අදාළ දෙවන නියැදිය සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාප 4 ක් අහඹු ලෙස මීගමුව කලාපය තෝරාගෙන ඇත. එහිදීද අදාල පාසල් ලෙස I A B එහිදීද දෙවර්ගයේ පාසල් වල කෙරුනු පාසල් පාදක ඇගයීම් සැලසුම් තෝරාගෙන ඇත. දැනුම අවබෝධය

විශ්ලේෂණය සංලේෂණය ඇගයීම වන බ්ලූම්ගේ වර්ගීකරණයට අනුව ප්‍රධාන අංග යටතේ ප්‍රශ්න පත්‍ර විහිදී ඇති අයුරු නිරීක්ෂණය කර ඇත.

මේ පරිච්ඡේදය තුළින්ම ව්‍යාපාර හා ගිණුම්කරණ අධයයන විෂය සම්බන්ධව පාසල පදනම් කර ගත් ඇගයීම් සැලසුම් වල වලංගුතාව පුළුල් ලෙස විමර්ශනයට යොමු කොට ඇත. සෑම ඇගයීම් ප්‍රභේදයක්ම අසුවන සේ විවිධ පාසල් වල කරන ලද ඇගයීම් සැලසුම් විශ්ලේෂණය කරන පර්යේෂිකාව ඒවායින් ශිෂ්‍ය ප්‍රවීනතා මට්ටම් මැනීමෙහි ලා කොතරම් සාර්ථක වන්නේද යන්නත් එහි දුර්වලතාවන් හඳුන්වා දෙන්නට උත්සුක වෙයි.

අදාළ වර්ෂ වල විභාග ප්‍රශ්න පත්‍ර විෂය නිර්දේශයට අනුකූල විෂය වලංගුතාවද නිරීක්ෂණයත් අනතුරුව සියලු නිරීක්ෂණ අවසානයේදී පර්යේෂිකාව පැමිණි නිගමන නම්, පාසල් පදනම් කරගත් ඇගයීම් සම්බන්ධ ක්‍රියාවලියේදී දුර්වලතා මගහරවාගැනීමට ඉවහල් වෙයි. පර්යේෂිකාව එළඹි නිගමන අතර ඇගයුම් සැලසුම් නොතිබීම අරමුණු ලිවීමේ දුර්වලතා ඇගයීම් ප්‍රභේද කිහිපයකට පමණක් සීමාවීම නිර්ණායක ගොඩනැගීමේ දුර්වලතා වැනි කරුණුද තිබිණි. 2002, 2003, 2004 යන වර්ෂ වල අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙ.) විභාගයේ ව්‍යාපාර හා ගිණුම්කරණ විභාග ප්‍රශ්න පත්‍රයේ වලංගුතාව තිල් පත්‍ර ඇසුරෙන් වීම පරීක්ෂා කළ අතර එම ප්‍රශ්න පත්‍ර වල යම් යම් දුර්වලතා පැවති බැවින් වලංගුතාව හීනවීම පරිදි විභාග ප්‍රශ්න පත්‍රය සකසා තිබූ බව පර්යේෂිකාව අනාවරණය කරන ලදී.